# ශ්‍රී ලංකා රජය මානව හිමිකම් උල්ලංඝණය කරන්නන් ආරක්‍ෂා කරන බැවින්, මානව හිමිකම් කවුන්සිලය විසින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වින්දිතයින් ආරක්‍ෂා කිරීමට සහයෝගය දිය යුතුය. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලයේ 25 වන සැසිවාරයට ( 2014 මාර්තු 3-28) ඉදිරිපත් කළ ලිඛිත ප්‍රකාශය.

ශ්‍රී ලංකා ආණ්ඩුවේ හමුද සහ එල්. ටි. ටි. ඊ. ය අතර 2009 අගභාගයේ දී සිදු වූ ආයුධ සන්නද්ධ ගැටුමේ දී සිදු වුවායැයි දෝෂාරෝපණය කරනු ලබන යුද්ධ අපරාධ හා මානව සංහතියට එරෙහි අපරාධ සම්බන්ධයෙන්, ජාත්‍යන්තර මට්ටමේ විශ්වසනීය පරීක්‍ෂණයක් පැවැත්වීම ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් අවහිර කිරීමට සිය සම්පත් මෙහෙය වන අතර මානව හිමිකම් උල්ලංඝණය වූ දහස් ගණනකට හා ඔවුන් ගේ පවුල් වල සාමාජිකයින්ට යුක්තිය සත්‍ය හෙළිදරව් කිරීම හා හානිපූරණය කිරීම ද ප්‍රතික්ෂේප කරයි.

පසුගිය ආයුධ සන්නද්ධ ගැටුමේ දී, ශ්‍රී ලංකා ආණ්ඩුවේ හමුද මෙන්ම එල් ටි ටි ඊ ය විසින් ද සිදු කරන ලද බවට පිළිගත හැකි සාක්ෂි ඇති, අන්තර් ජාතික නීතීය උල්ලංඝණය කිරීමේ අපරාධ සම්බන්ධයෙන් දැඩි නිහැඩියාවක් පවතී. ශ්‍රී ලංකා ආණ්ඩුවේ හමුද විසින් බලහත්කාර අතුරුදහන් කිරීම්, අධිකරණ බාහ්‍ය ඝාතන, සිතා මතාම සිවිල් වැසියන් හා ආරක්ෂිත ස්ථාන වශයෙන් සැලකෙන රෝහල් වැනි ස්ථාන වලට බෝම්බ හෙළීම, ගැටුමට මැදි වී සිටි සිවිල් වැසියන්ට ආහාර පාන ලබා දීම සිතා මතාම වැළැක්වීම යන කාරණා සම්බන්ධයෙන් පිළිගත හැකි සාක්ෂි තිබේ. එල් ටි ටි ඊ සංවිධානයට සිවිල් වැසියන් ආරක්‍ෂක පලිහක් වශයෙන් පාවිච්චි කිරීම, පලා යාමට තැත් කළ සිවිල් වැසියන් ඝාතනය කිරීම හා ළමා සොල්දදුවන් බඳවා ගැනීම සම්බන්ධයෙන් චෝදනා එල්ල වී තිබේ. ශ්‍රී ලංකාණ්ඩුව සිය ආරක්‍ෂක හමුද විසින් සිදු කරන ලද අන්තර් ජාතික නීතීය යටතේ ගැනෙන අපරාධ සම්බන්ධ චෝදනා ප්‍රතික්ෂපප කරයි. මෙම චෝදනා වලට ලක් වී ඇති ඇතැම් නිලධාරීන් ආණ්ඩුවේ වගකිව යුතු තනතුරු තවමත් දරන අතර ආණ්ඩුව දිගින් දිගටම ජාත්‍යයන්තර සවාධීන පරීක්‍ෂණයක් සඳහා අවසරයක් නොදෙයි.

මානව හිමිකම් කවුන්සිලය විසින් 2012 දී සම්මත කරන ලද 19/2 දරන යෝජනාව මඟින් ශ්‍රී ලංකාවට අන්තර් ජාතික නීතීය උල්ලංඝණය වීමේ චෝදනා සම්බන්ධයෙන් වගවීමට සහතික වන මෙන් ඉල්ලා සිටින ලදී. 2013 සම්මත කරන ලද 22/1 යෝජනාව මඟින් ශ්‍රී ලංකාවෙන් අඛණ්ඩව වාර්තා වන මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව සහ අන්තර් ජාතික නීතීය හා අන්තර් ජාතික මානවීය නීතීය කඩ කිරීම පිළිබඳ නඟන දෝෂාරෝපණයන් ගැන ස්වාධීන හා විශ්වසනීය ජාත්‍යයන්තර විමර්ශනයක් සඳහා කරනු ලබන ඉල්ලීම නැවත සිහිපත් කරන ලද්දේය. එම යෝජනාව මඟින් තවදුරටත් ශ්‍රී ලංකාවට සිය නීතීමය වගකීම් සපුරාලීම පිණිස ගත යුතු අත්‍යවශ්‍ය සියළුම අතිරේක පියවරයන් මෙන්ම යුක්තිය, සමානත්මතාවය, වගවීම හා සංහිඳියාව සහතික කර සවාධීන ක්‍රියාමාර්ග ගන්නා මෙන් ද ඉල්ලා සිටියේය.

22/1 යෝජනාව සම්බන්ධයෙන් 2013 සැප්තැම්බර් 24 දින මානව හිමිකම් කවුන්සිලය වෙත යාවත්කාලීන වාර්තාවක් ඉදිරිපත් කළ මානව හිමිකම් කොමසාරිස්වරිය ශ්‍රී ලංකා ආණ්ඩුවට 2014 මාර්තු වන තෙක් සිය දේශීය විසඳුම පිළිගත හැකි හා දක ගත හැකි පියවරයන් ක්‍රියාත්මක කිරීමට කාලය දෙන මෙන් යෝජනා කළේය. මෙම පියවරයන් අතපසු කරන්නේ නම්, එබඳු අවස්ථාවක දී අන්තර් ජාතික ප්‍රජාවට සිය විමර්ශන යාන්ත්‍රණයක් පිහිටුවීමට පියවර ගන්නා මෙන් ද ඉල්ලා සිටියාය. (A/HRC/24/CRP.3/Rev.1, para 18). ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය මෙම අන්තර් ජාතික යාන්ත්‍රණය ස්ථාපිත කිරීමට කාලය එළඹ ඇතැයි තරයේ විශ්වාස කරයි.

ශ්‍රී ලංකා රජය විශ්වසනීය විමර්ශනයක් ආරම්භ නොකළා පමණක් නොව දෝෂාරෝපිත මානව හිමිකම් කඩ කළ තැනැත්තන්ට එරෙහිව ප්‍රසිද්ධ නඩු විභාගයන් ද නොපැවැත්විය. බරපතළ ලෙස මානව හිමිකම් උල්ලංඝණය කළ තැනැත්තන්ටම තවදුරටත් නිතිය හා සාමය රැකීමේ වගකීම පවරා තිබේ. 2013 යුද්ධ හමුදා අධිකරණයක් විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නිදොස් කරමින් මිලිටරි ක්‍රියාන්විතයේ අවසාන භාගයේ මිය ගිය හා තුවාල ලැබූ සිවිල් වැසියන් සම්බන්ධයෙන් වගකීම එල් ටී ටී ඊ ය විසින් ගත යුතු යැයි තීන්දු කරන ලදී. මෙම වාර්තාව මේ වන විටත් ප්‍රකාශයට පත් කොට නැත. ආයුධ සන්නද්ධ ගැටුමේ අවසාන කාලයේ දී එක්කෝ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බාර වූ එසේත් නැත්නම් යුද්ධ හමුදාව විසින් අල්ලා ගන්නා ලද තැනැත්තන් අධිකරණ බාහ්‍ය ඝා තන සම්බන්ධයෙන් 2013 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විමර්ශනයක් ආරම්භ කළේය. එහෙත් මෙම විමර්ශකයන් 2013 අවසානය වන විටත් යුද්ධ හමුදාවේ ක්ෂෙත්‍ර භාර නිලධාරීන් හැර වෙනත් කිසිවෙකු ගෙන් තොරතුරු විමසා නොතිබුනී.[1]

ආණ්ඩුවේ හමුදා විසින් හෝ එල් ටී ටී ඊ සංවිධානය විසින් අත්අඩංගුවට ගත් පසු අතුරුදහන් වූවන් පිළිබඳ තොරතුරු ඇතුළත් දිවුරුම් ප්‍රකාශ ඒ ඒ තැනැත්තන් ගේ ඥාතීන් විසින්, 2010 දී උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව වෙත භාර දෙන ලදී.[2] 2013 අගොස්තු මාසයේ දී මානව හිමිකම් කවුන්සිලයේ නියෝජිතයින් ගේ ශ්‍රී ලංකා සංචාරය ආසන්නයේ දී, කඩිමුඩියේ ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් තවත් ජනාධිපති කොමිෂන් සභාවක් පත් කළේය. එම කොමිෂන් සභාවේ කාර්ය භාරය වූයේ 1990-2009 මැයි 19 වනද අතරතුර කාලයේ දී උතුරු හා නැගෙනහිර පළාත් හි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ සොයා බලා වාර්තා කිරිමයි. මෙම කොමිෂන් සභාවට 2013 අවසානය වන විට පැමිණිලි 11,000 කට ආසන්න ප්‍රමාණයක් ලැබුන බව වාර්තා විය. මෙම කොමිෂන් සභාව නිසා තමන් ගේ පැහැර ගෙන යන ලද්ද වූ හෝ අතුරුදහන් වූ ඥාතීන් පිළිබඳ තොරතුරු හෙළිදරව් වේයැයි ද තමන්ට යුක්තියක් ඉෂ්ට වේයැයි ද ඔවුන් තුළ බලාපොරොත්තුවක් ඇති විය. මෙම කොමිෂන් සභාව 1990 සිට බලහත්කාරයෙන් අතුරුදහන් වූවන් පිළිබඳ සොයා බලා වාර්තා කිරිමට පත් කළ 10 වන ජනාධිපති කොමිෂන් සභාව වෙයි.[3] මෙම කොමිෂන් සභාව ද සිය පූර්වගාමී කොමිෂන් සභා මෙන්ම මූල්‍ය හා දේශපාලන ස්වාධීනත්වයකින් තොර වූයේ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ සුදුසු පිළිවෙතක් ද නොවීය. මීට ඉහත කොමිෂන් සභාවන් හි දී මානව හිමිකම් කඩ කළ තැනැත්තන් වශයෙන් හඳුනා ගනු ලැබූයේ අතළොස්සක් පමණ පිරිසක් වන නමුත් ඔවුන් මේ වන තෙක් අධිකරණයක් ඉදිරියට පමුණුවා නොමැත.[4] මේ අතර අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් සත්‍ය හෙළිදරව් කර ගැනීම පිණිස උද්ඝෝෂණය කරන්නන් මර්දනය කිරිම ද වාර්තා වෙයි. උදහරණයක් වශයෙන් 2013 දෙසැම්බර් 10 මානව හිමිකම් දිනයේ ත්‍රිකුණාමලයේ දී අතුරුදහන් වූවන් ගේ පවුල් වල සාමාජිකයින්ට පොලිසිය බලා සිටිය දීම පහර දීම දැක්විය හැකියි.[5]

මානව හිමිකම් කවුන්සිලයේ නියෝජිතයින්ට 2013 අගෝස්තු මාසයේදී සිවිල් සමාජයේ සාමාජිකයින් විසින් භාර දෙන ලද සංදේශයෙන් ශ්‍රී ලංකා රජය විසින් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරිමේ ඇල් මැරුන සවභාවය පිළිබඳ අවධානය යොමු කළේය.[6] ශ්‍රී ලංකාව තුළ දිර්ඝ කාලයක සිට නිර්මාණය වී තිබෙන වරදින් නිදොස් කිරීමේ වාතාවරණය තුළ, ආණ්ඩුවේ පිළිගත හැකි මානව හිමිකම් ආරක්ෂා කිරීමේ පිළිවෙතක් දක්නට නොලැබෙන අතරම තවදුරටත් නොකඩවාම බරපතළ ලෙස මානව හිමිකම් උල්ලංඝණය වීම ද සිදු වේ.

ක්‍රියාධරයන් මෙන්ම මාධ්‍යවේදීන් විශේෂයෙන්ම වගවීම පිළිබඳව හඬ නගන්නන් ට තර්ජනය කිරිම පහර දීම වාර්තා වේ. බෞද්ධ නොවන අන්‍ය ආගමිකයින් ගේ ආරාම වලට ජාතිවාදී බෞද්ධ උද්ඝෝෂකයින් විසින් පහර දීම නොකඩවාම සිදු වේ. මාධ්‍ය වාර්තා වල පළ වන ආගමික නායකයින් ගේ ප්‍රකාශ වලට අනුව ඇතැම් පළාත් වල දේශපාලන බලධාරීන් විසින් ම බෞද්ධ නොවන ආගමික ස්ථාන වසා දමන්නට නියෝග කොට ඇත. මේ කිසිදු ප්‍රචණ්ඩ ක්‍රියාවක් වැළැක්වීමට පොලිසිය අසමත්ය.

ජිනිවා හි මානව හිමිකම් කවුන්සිලයේ ශ්‍රී ලංකාව පිළිබඳ සැසි වාරයන්ට සමගාමීව මෙරට මානව හිමිකම් ක්‍රියාධරයන් විසින් ජිනිවා වෙත තොරතුරු සංනිවේදනය කරනු ඇතැයි යන අනුමානය මත ඔවුන් තාඩන පීඩනයන් ට ලක් කිරිම හා අත්අඩංගුවට ගැනිම සිදුවේ. 2013 නොවැම්බර් මස ශ්‍රී ලංකාවේ පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව පැවති අවස්ථාවේ දිද මේ ආකාරයටම මානව හිමිකම් ක්‍රියාධරයන් ට තාඩන පිඩනය කිරිම හා අත් අඩංගුවට ගැනීම සිදු විය. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයේ වෙත ලැබි තිබෙන තොරතුරු අනුව ඉහත කී සිද්ධීන් සම්බන්ධයෙන් කරන ලද කිසිම පැමිණිල්ලක් විභාග කිරීම හෝ සැකකරුවන් අධිකරණය වෙත ඉදිරිපත් කොට නැත.

අට වසරක් ගෙවී ගොස් ඇති නමුත් 2006 ත්‍රිකුණාමලයේ පාසැල් සිසුන් පස් දෙනා ශ්‍රී ලංකාඩුණ්වේ ආරක්ෂක හමුද සාමාජිකයින් විසින් ඝාතනය කිරිම සම්බන්ධයෙන් කිසිම පුද්ගලයෙකුට විරුද්ධව අධිකරණයට පැමිණිලි කොට නැත. එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලයේ නියෝජිත පිරිසේ ශ්‍රී ලංකා සංචාරය අභිමුඛයේ දී මෙම සිද්ධිය සම්බන්ධයෙන් විශේෂ පොලිස් බලකායේ සාමාජිකයින් 12 දෙනෙකු අත් අඩංගුවට ගත් නමුත් පසුව ඔවුන් ඇප මත මුද හැරියේය. මෙම කණ්ඩායම 2006 දිත් සැක පිට අත්අඩංගුවට ගත් නමුත් එදත් සාක්ෂි අප්‍රමාණවත් බැවින් නිදහස් කරන ලදි. මෙම සිද්ධිය සිදුවන අවස්ථාවේ එතැන සිටි අණ දෙන නිලධාරියා ඇසින් දුටු සාක්ෂිකරුවන් විසින් හඳුනා ගන්නා ලද අතර ඔහුට මේ දක්වා කිසිදු චෝදනාවක් ඉදිරිපත් කොට නැත. මේ වන විට නැවත වරක් ත්‍රිකුණාමලයේ මහේස්ත්‍රාත් අධිකරණයේ මුලික නඩු විභාගයක් ආරම්භ කොට ඇති අතර එය දින නියමයක් නොමැතිව කල් යන නඩු විභාගයක් බවට පත් වි තිබේ.

2006 අගෝස්තු මාසයේ ප්‍රංශ ආධාර සංවිධානයක් වු ඇක්ෂන් කොන්ට්‍රා ලා ෆාම් සංවිධානයේ සාමාජිකයින් 17 දෙනෙකු ඝාතනය සම්බන්ධයෙන් මේ දක්වාම කිසිවෙක් සැක පිට අත් අඩංගුවට ගෙන නොමැති අතර මෙම සිද්ධිය සම්බන්ධ වගකිම ආරක්ෂක හමු.ද විසින් භාර ගත යුතු බවට පිලිගත හැකි සාක්ෂි ඉදිරිපත් වි තිබේ.

ඉතාමත් පැහැදිලි සාක්ෂි තිබෙන බරපතල මානව හිමිකම් කඩවිම් සම්බන්ධයෙන් පවා ආණ්ඩුව කිසිදු පියවරක් නොගැනිමත් විසම්මුතිය නොඉවසීම හා යුක්තිය සහතික නොවිම හේතු කොට ගෙන දේශීය විසඳුමක් කෙසේ වෙතත් ජාත්‍යයන්තර විමර්ශනයක හා නියාමනයක අවශ්‍යතාවය කැපි පෙනෙයි.

මානව හිමිකම් කවුන්සිලය:

- ශ්‍රී ලංකා ආණ්ඩුව හා එල් ටි ටි ඊ ය විසින් අන්තර් ජාතික නිතීය උල්ලංඝණය කරමින් සිදු කරන ලදැයි දෝෂාරෝපණය කරනු ලබන අපරාධ සම්බන්ධයෙන් ස්වාධින ජාත්‍යයන්තර විමර්ශනයක් පවත්වන බවටත්: ප්‍රමාණවත් සාක්ෂි තිබෙන මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ පැමිණිලි අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි අපක්ෂපාත නඩු විභාගයක් පවත්වන බවටත්:
- දැනට ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රගතිය හා ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රියාවලිය ඇතුළු අනෙකුත් ක්‍රියාපටිපාටීන් නියාමනය කරන සිවිල් සමාජ සාමාජික සාමාජිකාවන් ගේ අඩන්තේට්ටම් කිරිම් හා පලිගැනිම් නතර කරන බවට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් සහතිකයක් ලබා ගන්නා මෙන් ද:
- එක්සත් ජාතීන් සංවිධානය සමඟ සහයෝගයෙන් කටයුතු කරන බවට සහතික වන මෙන්ද,
- ශ්‍රී ලංකා ආණ්ඩුව සිය පුරවැසියන්ට කරනු ලබන තාඩන පීඩන හා පළිගැනිම් නතර කරන එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් ක්ෂෙත්‍රයේ යාන්ත්‍රණයන් ශක්තිමත් කරන මෙන් ද ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය ඉල්ලා සිටියි.

ශ්‍රී ලංකා ආණ්ඩුව:

- අන්තර් ජාතික නිතීය යටතට ගැනෙන අපරාධ සම්බන්ධයෙන් සම්බන්ධයෙන් එල්ල කර තිබෙන සියළුම චෝදනා විභාග කිරීම හා පිළිගත හැකි සාක්ෂි තිබෙන සෑම පැමිණිල්ලක්ම අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව ස්වාධීන අධිකරණයක් මගින් සාධාරණ නඩු විභාගයක් පැවැත්වීම:
- භාෂණයේ නිදහස පිළිබඳ අයිතිය, සමාගමයේ හා සංවිධානය වීමේ නිදහස, ආරක්ෂා කරන බවට සහතික වන බවටත් මානව හිමිකම් ක්‍රියාධරයන්ට විරුද්ධව කරනු ලබන අඩන්තේට්ටම් හා පළිගැනිම් නතර කරන ලෙසටත් පුද්ගලයන් හා ඔවුන් ගේ ආගම ජාතීය හෝ දේශපාලන මතය නොසලකා සියළු මත ඉවසන විසම්මුතික ප්‍රතිපත්තියක පිහිටා ක්‍රියා කරන බවටත්

- සුළු ජාතීන් ගේ ව්‍යාපාර හා ආගම් නිතීයේ ආධිපත්‍ය යටතේ ආරක්ෂා කරන බවටත් ,

- එක්සත් ජාතීන් ගේ සංවිධානයේ විශේෂ ක්‍රියාපටිපාටියට සම්පූර්ණ සහයෝග දෙමින් ඔවුන් ගේ ශ්‍රී ලංකා සංචාරයට සම්පූර්ණ අනුග්‍රහය දක්වන ලෙසටත්

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය ඉල්ලා සිටියි.

---

[1] උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස සකස් කරන ලද ජාතික ක්‍රියාකාරි සැලැස්ම- 2014ත්මාවන් අනුව (2013) 2 පිටුව

[2] Joint Civil Society Submission to Ms Navi Pillay", 1 September 2013, http://www.eyesrilanka.com/2013/09/01/joint-civil-society-submission-to-ms-navi-pillay/, accessed 31 January

[3] See, "A list of Commissions and Committees appointed by the GoSL (2006- 2013)," Centre for Policy Alternatives, Sri Lanka, http://www.cpalanka.org/a-list-of-commissions-and-committees-appointed-by-gosl-2006-2013/

[4] Amnesty International, *Sri Lanka: Twenty years of make-believe. Sri Lanka's Commissions of Inquiry* (Index: ASA 37/005/2009) June 2009, http://amnesty.org/en/library/info/ASA37/005/2009/en

[5] BBC, "Sri Lanka rally to protest against disappearances," 10 December 2013, http://www.bbc.co.uk/news/world-asia-25323892

[6] "Joint Civil Society Submission to Ms Navi Pillay."